# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2022 ඔක්තෝම්බර්


**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

දුරකථනය: **011-2147414** ෆැක්ස්: **011-2877945** ඊමේල්: prices@statistics.gov.lk


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ජාතික පාරිභෝගික මිල දර්ශකය මාසිකව නිකුත් කරනු ලබන අතර, 2022 ඔක්තෝම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (Headline Inflation) 70.6%ක් බව එහි අධ්‍යක්ෂ ජනරාල් මෙම නිවේදනය නිකුත් කරමින් සඳහන් කර ඇත. 2022 සැප්තැම්බර් මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 73.7%ක් ලෙස වාර්තා විය. 2022 ඔක්තෝම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 38.5%ක හා ආහාර නොවන කාණ්ඩයේ 32.1%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2021 ඔක්තෝම්බර් මාසයේ 8.3%ක්වූ මතුපිට උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.4%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2.9%ක් විය. 2021 ඔක්තෝම්බර් මාසයට සාපේක්ෂව 2022 ඔක්තෝම්බර් මාසයේ උද්ධමනය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර හා ආහාර නොවන කාණ්ඩවල පැවති ඉහළ මිල මට්ටම ය. කෙසේ වෙතත්, ආහාර කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය (ලක්ෂ්‍යමය) 2022 සැප්තැම්බර් මාසයේදී 85.8% සිට 2022 ඔක්තෝම්බර් මාසයේදී 80.9% දක්වා අඩු වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික උද්ධමනය(ලක්ෂ්‍යමය) ද 2022 සැප්තැම්බර් මාසයේදී 62.8% සිට 2022 ඔක්තෝම්බර් මාසයේදී 61.3% දක්වා අඩු විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2022 සැප්තැම්බර් මාසයේ 256.2ක් වූ දර්ශකාංකය 2022 ඔක්තෝම්බර් මාසයේ 256.9ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2022 ඔක්තෝම්බර් මාසයේ දර්ශකාංකය 0.7ක වැඩිවීමක් එනම් 0.3%ක ප්‍රතිශතාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ දර්ශක අගය 0.41%කින් අඩුවීම සහ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය 0.69%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩය සැළකූවිට අළුත් මාළු, හාල්, කරවල, පොල්තෙල්, සීනි, මයිසූර් පරිප්පු, අර්තාපල්, කුකුල්මස්, බිස්කට්, තිරිඟුපිටි, මිරිස්කුඩු සහ අමුමිරිස් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීමක් ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත. එහෙත් කිරිපිටි, ලොකුළුණු, අළුත් පළතුරු, දෙහි, තේ කොළ/කුඩු, පොල්, රතුළූණු, පාන්, හාල්පිටි, එළවළු,ළදරු කිරිපිටි, මුංඇට හා පපඩම් යන ආහාර ද්‍රව්‍ය වල මිලෙහි වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2022 ඔක්තෝම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ දර්ශක අගය වැඩිවීම සඳහා ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය' (*අරක්කු*), ‘රෙදිපිළි හා පාවහන්', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' (*සබන් වර්ග*), 'සෞඛ්‍ය' (*ඖෂධ නිෂ්පාදන මිලදී ගැනීම හා පෞද්ගලික රෝහල් ගාස්තු*), 'සන්නිවේදන' (*දුරකථන ගාස්තු - ජංගම හා ස්ථාවර දුරකථන ගාස්තු*), 'විනෝදාත්මක හා සංස්කෘතික' (*අභ්‍යාස පොත් හා ලිපිද්‍රව්‍ය*), ‘අධ්‍යාපන' (අමතර පන්ති *ගාස්තු*), 'ආපනශාලා සහ හෝටල්' සහ ‘විවිධ භාණ්ඩ හා සේවා' (*සුවඳ සබන් වර්ග*) යන කාණ්ඩවලට අයත් අයිතමයන්ගේ මිල වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා ඇත. එසේ වුවත් පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන ' (*ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය*) සහ ‘ප්‍රවාහන' (*පෙට්‍රල් හා ඩීසල්*) යන කාණ්ඩවල අයිතමයන්ගේ මිලෙහි අඩුවීමක් වාර්තා වී ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ ලක්ෂ්‍යමය වෙනස්වීම් පදනම්ව නිතර මිල උච්චාවචනය වන ආහාර වර්ග, බලශක්ති සහ ප්‍රවාහන අයිතමයන් ඉවත් කිරීමෙන් පිළිඹිබු වන යටිදැරි උද්ධමනය (Core Inflation) 2022 සැප්තැම්බර් මාසයේ 64.1% සිට 2022 ඔක්තෝම්බර් මාසයේ 62.4% දක්වා අඩුවීමක් වාර්තා විය.




## ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | | | | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | | ලක්ෂ්‍යමය උද්ධමනය (%) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | ජා.පා.මි.ද. (යටිදැරි) | ජා.පා.මි.ද. (මතුපිට) | | | ජා.පා.මි.ද. (යටිදැරි) |
| | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | | | | සියළුම අයිතම | ආහාර | ආහාර නොවන | |
| 2021 | ඔක්. | 150.6 | 162.6 | 141.2 | 150.6 | 2.1 | 2.3 | 8.3 | 11.7 | 5.4 | 7.2 |
| | නොවැ. | 155.3 | 171.5 | 142.6 | 153.0 | 3.1 | 1.6 | 11.1 | 16.9 | 6.2 | 8.8 |
| | දෙසැ. | 161.0 | 182.1 | 144.5 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 21.5 | 7.6 | 10.8 |
| 2022 | ජන. | 166.0 | 188.3 | 148.4 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 24.4 | 10.2 | 12.9 |
| | පෙබ. | 167.8 | 190.6 | 149.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 24.7 | 11.0 | 14.1 |
| | මාර්තු | 172.7 | 195.2 | 154.9 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 29.5 | 14.5 | 17.3 |
| | අප්‍රේල් | 190.3 | 218.8 | 167.9 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 45.1 | 23.9 | 27.9 |
| | මැයි | 208.7 | 242.2 | 182.4 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 58.0 | 34.2 | 37.7 |
| | ජූනි | 231.5 | 276.6 | 196.0 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 75.8 | 43.6 | 49.3 |
| | ජූලි | 244.4 | 289.3 | 209.1 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 82.5 | 52.4 | 57.3 |
| | අගෝ. | 250.4 | 294.3 | 215.8 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 84.6 | 57.1 | 60.5 |
| | සැප්. | 256.2 | 296.5 | 224.5 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 85.8 | 62.8 | 64.1 |
| | ඔක්. | 256.9 | 294.1 | 227.7 | 244.6 | 0.3 | 1.3 | 70.6 | 80.9 | 61.3 | 62.4 |